[redacted]

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**5**

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2016

# පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2016 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

විභාග අංකය : ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු සහතික කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න


EXAMMOOD.LK
EXAMMOOD.LK

● අංක 1 සහ 2 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට, ගැළපෙන කොටස තෝරන්න.

1.




2.





3. පහත දී ඇති රූපවලින් එක් රූපයක් අනෙක් රූප දෙකට වඩා වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.




4. පහත දී ඇති රූපවලින් වක්‍ර රේඛා පමණක් ඇති රූපය තෝරන්න.




5. පහත දී ඇති සංඛ්‍යා සහ ඒ වටා ඇඳ ඇති රූප අනුව 60 සංඛ්‍යාව වටා ඇඳිය යුතු රූපය කුමක් ද?







EXAMMOOD.LK
EXAMMOOD.LK

විභාග අංකය : ......................................

6. ආහාර ද්‍රව්‍ය ඇසුරුමක ලේබලයක කොටසක් පහත දී ඇත.

① → 2016.01.07

② → 2016.08.07 SLS

ලේබලයට අනුව, ① හා ② විය හැක්කේ පිළිවෙළින් මොනවා ද?

(1) නිෂ්පාදිත දිනය හා වෙළඳපොළට නිකුත් කළ දිනය
(2) වෙළඳපොළට නිකුත් කළ දිනය හා කල් ඉකුත්වීමේ දිනය
(3) නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය

● පහත දී ඇත්තේ සිගිති පොළක වෙළඳ කුටි සැලැස්මකි. ඒ ඇසුරෙන් අංක 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| සිගිති පොළ - 2016 | | | |
|---|---|---|---|
| ① වියළි ආහාර ද්‍රව්‍ය | ② එළවලු | ③ පලතුරු සහ පලා වර්ග | ④ මල් පැළ |

7. සීනි, ගොටු කොළ හා ඉදුණු කෙසෙල් මිල දී ගැනීමට යා යුතු වෙළඳ කුටිවල අංක මොනවා ද?

(1) ① හා ② (2) ① හා ③ (3) ② හා ③

8. තරාදියක් භාවිත **නොකරන** කුටියක් වීමට වඩාත් ම ඉඩ ඇත්තේ කුමක් ද?

(1) ① (2) ③ (3) ④

9. පහත දී ඇති වාක්‍යවලින් නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.

(1) අපි යුතුකම් ඉටු කරමු.
(2) අප යුතුකම් ඉටු කරමු.
(3) අපි යුතුකම් ඉටු කරමු.

10. 'කාර්යක්ෂමතාව' යන වචනයේ ඇති අකුරු කිහිපයකින් සෑදිය හැකි අර්ථවත් වචනයකි.

(1) වර්ෂය (2) කාමරය (3) තර්කය

11. පහත දී ඇති ඡේදය කියවන්න.

වනාන්තරය සතුන්ට රජදහනකි. මිනිස්සු වනසතුන් △1 ආශා කළහ. මිනිසුන්ට එම අවස්ථාව ලබා දීමේ අරමුණින් වනාන්තරයෙන් අල්ලාගත් සතුන් කූඩු කර ප්‍රදර්ශනය කිරීම ආරම්භ කෙරිණි. ඒ සමග ම ලෝකයේ △2 සංකල්පය බිහි විය.


ඡේදයේ △1 සහ △2 ස්ථානවලට වඩාත් සුදුසු වචන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දැකීමට, වනෝද්‍යාන
(2) ඇල්ලීමට, සත්වෝද්‍යාන
(3) නැරඹීමට, සත්වෝද්‍යාන



EXAMMOOD.LK
EXAMMOOD.LK

- පහත දී ඇති රූප සටහන සලකා අංක **12** සහ **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**12.** $c$ හා $i$ අක්ෂරවලින් නිරූපණය කළ හැකි සතුන් දෙදෙනකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) හාවා, උකුස්සා
(2) අලියා, වවුලා
(3) නරියා, කොකා

**13.** ඉහත රූප සටහන තුළ පිළිවෙළින්, සිංහයා හා කපුටා නිරූපණය කිරීමට යොදා ගත හැකි අක්ෂර යුගලයක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) $d, f$ (2) $g, m$ (3) $h, g$

**14.** ශ්‍රී ලංකාවට නිදහස ලැබුණේ කුමන සියවසේ කුමන දශකයේ ද?

(1) 19 වන සියවසේ 5 වන දශකයේ
(2) 20 වන සියවසේ 4 වන දශකයේ
(3) 20 වන සියවසේ 5 වන දශකයේ

**15.** 2000.05.01 දින ශ්‍රී ලංකාවේ උපත ලැබූ අයකු 2016.06.01 දිනය වන විට සූර්යයා වටා ගමන් කර ඇති සම්පූර්ණ වට ගණන කීය ද?

(1) 10 (2) 16 (3) 17

**16.** පාසලක එක්තරා උත්සවයක් ආරම්භයේ දී ඉටිපන්දම් 9 ක් දැල්වීමට සූදානම් කර ඇත. එක් ඉටිපන්දමක් දැල්වී තිබෙන කාලය මිනිත්තු 30 කි. ඉටිපන්දම් 9 එකවර දැල්වුවහොත් ඒ සියල්ල ම දැල්වී තිබෙන කාලය කොපමණ ද?

(1) මිනිත්තු 30 යි
(2) මිනිත්තු 270 යි
(3) මිනිත්තු 300 යි


**17.** රජයේ පාසලක පළමු වාර පරීක්ෂණය ආරම්භ වූයේ මාර්තු 18 වැනි බ්‍රහස්පතින්දා ය. මාර්තු 23 වැනි දා ප්‍රසිද්ධ නිවාඩු දිනයකි. වාර පරීක්ෂණය දින 6 ක් පැවැත්වුණි. වාර පරීක්ෂණය අවසන් වූ දවස කවදා ද?

(1) සඳුදා
(2) බ්‍රහස්පතින්දා
(3) සිකුරාදා

[පස්වැනි පිටුව බලන්න


- අංක 18 සහ 19 ප්‍රශ්නවල රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරන්න.

**18.**



(1) (2) (3)

**19.**



(1) (2) (3)

**20.** නිරෝගී ඇත් රංචුවක සිටින ඇතුන්ගේ දළ සංඛ්‍යාවේත් පාද සංඛ්‍යාවේත් එකතුව 132 කි. එම රංචුවේ සිටින මුළු ඇතුන් සංඛ්‍යාව කීය ද?

(1) 22 (2) 33 (3) 66

- පහත දී ඇති පුවත්පත් වාර්තාව කියවා අංක 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි එක ම වැසි වනාන්තරය වන මොරඇල්ල වනාන්තරය, අනවසර දැව කැපීම්, වගාවන් සඳහා එළිපෙහෙළි කිරීම්, කුඩා විදුලිබලාගාර ඉදිකිරීම් වැනි තත්ත්ව යටතේ දැඩි පාරිසරික අනතුරකට ලක් වී තිබේ. මහවැලි ගඟ ඇතුළු ගංගාවන් රැසක් පෝෂණය කරන මෙම වනාන්තරයෙහි ශාක විශේෂ 192 ක් පමණ හඳුනා ගෙන ඇති අතර එයින් 92 ක් පමණ ශ්‍රී ලංකාවට ආවේණික ශාක ලෙස සැලකේ. එයින් ද ශාක විශේෂ 21ක් මේ වන විට තර්ජනයට ලක් වී ඇත.

(2015.11.09 දින පුවත්පතක පළ වූ ලිපියක් ඇසුරෙනි.)


**21.** මොරඇල්ල වනාන්තරය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ

(1) මධ්‍යම පළාතේ ය. (2) ඌව පළාතේ ය. (3) සබරගමුව පළාතේ ය.

**22.** මෙම පුවත්පත් වාර්තාව සඳහා වඩාත් සුදුසු ශීර්ෂ පාඨයක් (මාතෘකාවක්) වන්නේ පහත කවරක් ද?

(1) මොරඇල්ල වනාන්තරය වගාවන් සඳහා එළිපෙහෙළි කෙරේ.
(2) මොරඇල්ල වනාන්තරය පාරිසරික අනතුරකට ලක් වී ඇත.
(3) මොරඇල්ල වනාන්තරයේ ශාක විශේෂ හඳුනා ගැනේ.

**23.** A, B, C හා D යන එක් එක් ත්‍රිකෝණය තුළ ඇති විශාල ම ඉලක්කම භාවිත කර සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව කුමක් ද?





(1) 9 765

(2) 5 679


(3) 2 348

**24.** මෙහි දී ඇති සටහනේ සංඛ්‍යා පිහිටන්නේ යම් කිසි රටාවකට අනුවයි. එම රටාව අනුව ( ) තිබෙන තැනට තිබිය යුතු සංඛ්‍යාව කීය ද?





(1) 24 (2) 12 (3) 6

**25.** පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව තෝරන්න.




(1) 9 (2) 6 (3) 4

**26.** සමචතුරස්‍රාකාර හැඩය ඇති කඩදාසියක් (1) රූපයේ දැක්වේ. එහි හරි මැද වෘත්තාකාර සිදුරක් ඇත. (2) රූපයේ දැක්වෙන කඩඉරි දිගේ කඩදාසිය දෙවරක් නවනු ලැබේ. ඉන්පසු (3) රූපයේ දැක්වෙන පරිදි දෙවැනියට නවන ලද දාරයේ ඉහළින් කුඩා කොටසක් කපා ඉවත් කරනු ලැබේ.



(1) රූපය (2) රූපය (3) රූපය

කඩදාසිය සම්පූර්ණයෙන් ම දිගහැරිය විට දැකිය හැකි මුළු සිදුරු ගණන කීය ද?


(1) 2 (2) 3 (3) 5

**27.** මෙම රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන කීය ද?


(1) 5 යි


(2) 6 යි

(3) 7 යි



**28.** පහත කොටුව තුළ දී ඇති සියල්ල ම සම්පූර්ණයෙන් ම භාවිත කර සැදිය හැකි රූපය තෝරන්න.





(1) (2) (3)

● පහත දී ඇති දැන්වීම් පුවරුව ඇසුරෙන් අංක **29** සහ **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

> <u>දේශීය වෛද්‍ය මධ්‍යස්ථානය</u>
>
> සෙනසුරාදා හැර සතියේ සෑම දිනක ම
> පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වාත්
> ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වාත් ප්‍රතිකාර කරනු ලැබේ.

**29.** වෛද්‍යවරයා සතියක් තුළ රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට අපේක්ෂා කරන මුළු පැය ගණන,

(1) 24 කි. (2) 42 කි. (3) 49 කි.

**30.** දැන්වීම් පුවරුවේ සඳහන් තොරතුරු අනුව, පහත දී ඇති කුමන ප්‍රකාශය නිවැරදි ද?

(1) වෛද්‍ය මධ්‍යස්ථානයේ දී රෝගීන්ට නේවාසික ව ප්‍රතිකාර ලබා ගත හැකි වෙයි.
(2) වෛද්‍යවරයා බෝ වන රෝග සඳහා පමණක් ප්‍රතිකාර කරයි.
(3) වෛද්‍යවරයා ඖෂධ සඳහා ශාකමය ද්‍රව්‍ය බහුල ව භාවිත කරයි.

**31.** සිද්ධියකට අදාළ රූප 5 ක් පහත දී ඇත.



A B C D E

සිද්ධිය අනුව, දී ඇති රූප අනුපිළිවෙළට පෙළගැස්වූ විට ලැබෙන්නේ පහත කවරක් ද?

(1) B, C, D, A, E
(2) C, B, D, E, A
(3) C, B, D, A, E

**32.** බස් රථයක් තුළ දෙදෙනකු බැගින් වාඩිවිය හැකි මගී ආසන 15 ක් ද හයදෙනකුට වාඩිවිය හැකි එක් මගී ආසනයක් ද තිබේ. එම බස් රථයේ වාඩි වී යා හැකි උපරිම මගීන් ගණන කීය ද?

(1) 21 (2) 36 (3) 42

**33.** ළමයින් 4 දෙනකු හා වැඩිහිටියන් 3 දෙනකු සඳහා කිරි තේ සකස් කිරීමට කිරි ලීටරයක් අවශ්‍ය වේ. ඒ අනුව, ළමයින් 20 දෙනකු හා වැඩිහිටියන් 15 දෙනකු සඳහා කිරි තේ සකස් කිරීමට අවශ්‍ය කිරි ලීටර ගණන කීය ද?

(1) 5 (2) 7 (3) 15



EXAMMOOD.LK


**34.** 1 සිට 100 තෙක් සංඛ්‍යා ලිවීමේ දී 2 ඉලක්කම ලිවිය යුතු වාර ගණන කීය ද?

(1) 10 (2) 19 (3) 20

**35.** දිග, පළල හා උස 5 cm බැගින් වන ලී ඝනකයකින් දිග, පළල හා උස 1 cm බැගින් වන කුඩා ඝනක කීයක් කැපිය හැකි ද?

(1) 125 (2) 25 (3) 15

**36.** එක් දිනක් තුළ පැවැත්වුණු පරිසර දින වැඩසටහන් මාලාවක, ①, ②, ③ හා ④ යන වැඩසටහන් ආරම්භ වූ වේලාව පහත සඳහන් ඔරලෝසු මුහුණත්වල දැක්වේ.





① ② ③ ④

එක් වැඩසටහනක් අවසන් වූ විගසම ඊළඟ වැඩසටහන ආරම්භ විය. ④ වන වැඩසටහන අවසන් වූයේ දහවල් 12.00 ට ය. වැඩි ම කාලයක් පැවැත්වුණු වැඩසටහන කුමක් ද?

(1) ① (2) ② (3) ③

**37.** දිගහරින ලද ඝනකයක රූපයක් ඉදිරියෙන් දී ඇත. එහි මුහුණත්වල සංඛ්‍යා සටහන් කර තිබේ. මෙය ඝනකයක් ලෙස නැවත සකස් කළ විට, ප්‍රතිවිරුද්ධ මුහුණත්වල ඇති සංඛ්‍යා අතර සම්බන්ධතාවක් හඳුනා ගත හැකි වේ. එම සම්බන්ධතාව අනුව හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.




(1) 22

(2) 21

(3) 20

**38.** පහත දැක්වෙන්නේ කම්බි රාමු තුනකි. P කෙළවරේ සිටින කුහුඹුවකුට, එක ම මාර්ගයේ දෙවතාවක් ගමන් නොකර සියලු ම මාර්ගවල ගමන් කළ හැක්කේ කුමන රාමුවේ ද?




(1) (2) (3)

**39.** එක ම ඉලක්කම එක් වතාවකට වඩා තිබෙන සේ කාඩ්පත් 20 ක එක් ඉලක්කම බැගින් ලියා ඇත. කාඩ්පත් 10 ක ඇති ඉලක්කම්වල එකතුව 12 කි. ඉතිරි කාඩ්පත් 10 හි ඇති ඉලක්කම්වල එකතුවට තිබිය හැකි වැඩි ම අගය,

(1) 20 කි. (2) 60 කි. (3) 90 කි.

**40.** ✤ ✤ ✤ = ○ ○ ○ ○ හා □ □ = ✤ ✤ ✤ ✤ වේ. පහත දී ඇති කුමන සම්බන්ධතාව නිවැරදි ද?

(1) ✤ ✤ ✤ ✤ ✤ = ○ ○ ○ ○ □ □

(2) □ □ ✤ □ = ○ ○ ○ ○ ✤ ✤

(3) ✤ ✤ ✤ ○ □ = ○ ○ ○ ○ ○ ✤ ✤

* * *

273573

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**5**

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2016

## පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2016 අගෝස්තු

## II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

**විභාග අංකය :** ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
* පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉරි මත** ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන එට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK

**1.** පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

පෙනෙන තෙක් මානයේ විහිදී ඇති වෙල්යාය ගොයම් පැළ නිසා නිල්ල ගැසී ඇත. නියර දිගේ තණකොළ අතර වැවී තිබෙන කුඩා පැළෑටිවල පුංචි පුංචි මල් පිපී ඇත. ඒ මල් රතුපාටින්, කහපාටින්, දම්පාටින් දිලෙන්නේ ගොයම් පැළවල සුන්දරත්වය තව තවත් වැඩි කරමින් ය. කුරුල්ලන්ගේ කිචි බිචි නාදය පරිසරයේ නිහඬ බව බිඳියි. වෙල්යායේ ඈත කොනකින් එන බටනළා වාදනයක හඬක් සුළඟට මුසුවෙයි.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන, **තිත් ඉරි මත ලියන්න.**

(i) ඡේදයෙන් කියවෙන පරිසරය කුමක් ද?

: ........................................................................................................

(ii) කුඩා පැළෑටි වැවී තිබුණු ස්ථානය පිළිබඳ ව ඡේදයේ විස්තර කර ඇත්තේ කෙසේ ද?

: ........................................................................................................

(iii) බටනළා වාදනයක හඬ පැමිණියේ කොහේ සිට ද?

: ........................................................................................................

(iv) 'ළඟ' යන පදයට විරුද්ධාර්ථ පදයක් ඡේදයේ ඇත. එය සොයා ලියන්න.

: ........................................................................................................

(v) පාපිල්ල සහ ඇලපිල්ල යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

: ........................................................................................................

(vi) 'දර්ශනය වන සීමාවේ' යන අදහස, ඡේදයේ සඳහන් වන ආකාරය උපුටාගෙන ලියන්න.

: ........................................................................................................

**2.** අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) මුහුන / මුහුණ

(ii) විශේෂ / විශේශ

**3.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) ............ (ඔහු / ඔවුහු) දුරකථනය මේසය උඩ තැබුවේ ය.

(ii) ගායිකාවෝ ගීතයක් ............... (ගැයුවා ය / ගැයුවෝ ය).

(iii) ගුරුවරු අපට අවවාද ................ (දෙයි / දෙති).

(iv) මල් ............... (පිපෙයි / පිපෙති).

**4.** කොටුව තුළ දී ඇති වචනවලින් රකාරාංශය යෙදුණු වචනය **තිත් ඉර මත ලියන්න.**

| ඖෂධ, චාරිත්‍ර, මංගල්‍යය |
|---|

: ..................................................

**5.** ප්‍රස්තාව පිරුළක කොටසක් පහත දී ඇත. එම ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ වීමට හිස්තැනට තිබිය යුතු වචනය ලියන්න.

......................... ඉනී කපන්නා වගේ.

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

විභාග අංකය : ........................................



6. පහත දී ඇති අදහසට ගැළපෙන තනි වචනයක් **හිස් ඉර මත ලියන්න.**

වැස්ස ස්වල්පයක්වත් නොමැති කාලය : ........................................

7. පහත සඳහන් වගන්තිවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරාගෙන **එම යටින් ඉරක් අඳින්න.**

(i) කණ්ණාඩිය තුළින් ඔහුට තම **පිළිබිඹුව** පෙනුණි. මෙහි තද කළු අකුරුවලින් ඇති වචනයට අර්ථයෙන් සමාන වන්නේ ........................(රූපය / ප්‍රතිබිම්බය) යන්න ය.

(ii) ගස් වහර යනු ........................ (ලිවීමේ දී / කතා කිරීමේ දී) භාවිත කරන භාෂාවයි.

(iii) වප් මාසය ලෙස හැඳින්වෙන්නේ ........................ (ඔක්තෝබර් / දෙසැම්බර්) මාසයයි.

8. පහත සඳහන් කවියේ ඇති **හිස්තැන සම්පූර්ණ කරන්න.**

උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි     ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින්     නොවේ
අනුන් පිහිට තකමින් යුතුකම     හමුවේ
........................................................................

9. එක්තරා දැරියකගේ අදහස් ප්‍රකාශ වන ගීතයක පේළි හතරක් පහත දී ඇත. එය හොඳින් කියවන්න.

පිහිනා සිප් සයුර දෙතෙර
සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනෙක අවමන් මැද නොසෙල්වෙමි
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමි

(කුමාරදාස සපුතන්ත්‍රී විසින් රචනා කරන ලද ගීතයක කොටසකි)

ඉහත පේළි හතරෙහි එක් පේළියකින්, නොයෙකුත් අපහාස හමුවේ මෙම දැරිය කම්පා නො වන බව ප්‍රකාශ වේ. එම පේළිය උපුටාගෙන ලියන්න.

: ........................................................................

10. පහත සඳහන් වාක්‍යය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

මම ගමට ගියා : ........................................................................

11. (i) පහත දී ඇති ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල වචනය** ලියන්න.

waterfall : ........................................................................

(ii) රූපයේ දී ඇති සත්වයා සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචනය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.



: ........................................................................

12. පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරාගෙන **එම යටින් ඉරක් අඳින්න.**

(i) Where ..................... (is / are) the playground?

(ii) I am ..................... (go / going) out.

13. පහත සඳහන් වාක්‍යය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.

මෙය මගේ පාසලයි. : ........................................................................

[හතරවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

14. පහත සඳහන් **දෙමළ වචනයේ අර්ථය සිංහලෙන්** ලියන්න.

පුරා : ........................................


15. පහත සඳහන් වාක්‍යය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

ආයෙත් එන්න. : ........................................

16. පාසලේ වාර අවසාන නිවාඩුව ලැබෙන තෙක් මා බලා සිටියේ නොඉවසිල්ලෙනි. නිවාඩු කාලය විනෝදයෙන් ගත කරන ලෙසත් ඉගෙනීමේ වැඩ අමතක නොකරන ලෙසත් ගුරුතුමිය පැවසූ අයුරු මා සිත තුළ රැඳී තිබුණි. "පාසල් නිවාඩු කාලය මා ගත කළ අයුරු" යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක ම, වචන **පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.**)

- ........................................
  ........................................
- ........................................
  ........................................
- ........................................
  ........................................

- **දී ඇති හිස් ඉඩ මත පිළිතුරු සපයන්න.**

17. 


මෙම ගණක රාමුවෙන් නිරූපණය වන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

: ........................................


18. පහත දී ඇති සංඛ්‍යාවට පෙර ඇති සංඛ්‍යාවත් පසු ව ඇති සංඛ්‍යාවත් රෝම සංඛ්‍යාංකවලින් ලියන්න.

: ................ , ix, ................

19. සිලින්ඩරයක ඇති වක්‍ර පෘෂ්ඨ ගණන කීය ද? : ........................................

20. (i) $\frac{1}{4}$ ට තුල්‍ය භාගයක් ලියන්න. : ........................................

(ii) ඉදිරියෙන් දී ඇති රූපයෙන් 0.3 ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



21. 

මෙම රූපයට සමමිති රේඛා කීයක් ඇඳිය හැකි ද?

: ........................................

22. පැන්සල් 130 ක් 7 දෙනෙකු අතර සම සේ බෙදූ විට ඉතිරි වන පැන්සල් ගණන කීය ද?

: ........................................

[පස්වැනි පිටුව බලන්න.

**23.** පස්වරු 4 : 30 ට පොතක් කියවීමට ඇරඹූ ශයානිට එය කියවා අවසන් කිරීමට පැය 1 මිනිත්තු 35 ක් ගත විය. ඇය පොත කියවා අවසන් කළ වේලාව පැය විසි හතරේ ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට ඉලක්කමෙන් ලියන්න.

..........................................................


**24.**

| | |
|---|---|
| 275 | 80 |
| 324 | 139 |

කොටුව තුළ ඇති සංඛ්‍යාවලින් සංඛ්‍යා දෙකක් එකතු කළ විට 404 ලැබේ. එම සංඛ්‍යා දෙක තෝරා ලියන්න.

..........................................................

**25.** උද්‍යානයක කොටසක් පහත රූපසටහනේ දැක්වේ.




(i) ආපන ශාලාව පිහිටා ඇත්තේ ප්‍රධාන දොරටුවේ සිට කුමන දිශාවෙන් ද?

..........................................................

(ii) රූපසටහනේ දැක්වෙන **මාර්ගය ඔස්සේ** පුද්ගලයකු ප්‍රධාන දොරටුවේ **A** ස්ථානයේ සිට පොකුණේ **B** ස්ථානයට ගමන් කළේ නම්, ඔහු ගමන් කළ මුළු දුර කිලෝමීටර හා මීටරවලින් කොපමණ ද?

..........................................................


**26.**



මෙම රූපය තුළ ඇති සෘජුකෝණයකට වඩා අඩු කෝණ ගණන කීය ද?

..........................................................

**27.** පහත රූපයේ ඇති සෑම කුඩා කොටුවකම දිග 1 cm ද පළල 1 cm ද වේ. රූපයේ **අඳුරු කර ඇති හැඩ** හතර $A, B, C$ හා $D$ ලෙස නම් කර ඇත.




(i) $D$ අක්ෂරයෙන් පෙන්වන හැඩයේ පරිමිතිය කීය ද?

..........................................................

(ii) වර්ගඵලයෙන් සමාන හැඩවලට හිමි අක්ෂර ලියා දක්වන්න.

..........................................................

**28.** පොතක මිල රු. 40 ද පැන්සලක මිල රු. 12 ද ලෙස වෙළඳසැලක මිල දර්ශනයක සටහන් වී තිබුණි.

(i) වෙළඳසැලට ගිය අරුණිට පොත් තුනක් හා පැන්සලක් මිලට ගැනීමට අවශ්‍ය මුදල කීය ද?

..........................................................

(ii) අරුණි පොත් තුනක් හා පැන්සලක් ගෙන වෙළඳසැල්හිමියාට රු. 50 නෝට්ටු 3 ක් දුන්නේ නම්, ඇයට ලැබුණු ඉතිරි මුදල කීය ද?


..........................................................

[හැරවුම් පිටුව බලන්න.

29. සීනි 6 kg 500 g කින් සෑදිය හැකි 250 g සීනි පැකට්ටු ගණන කීය ද?

: ..............................................

30. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වූ එක්තරා පාසලක ශිෂ්‍යයන්ගෙන් ලකුණු 150 ට වඩා වැඩියෙන් ලබාගත් සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යා නිරූපණය කිරීමට මෙම ප්‍රස්තාරය ඇඳ ඇත.




(i) 5B පන්තියේ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 5C පන්තියේ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් තුන්ගුණයකි. 5C පන්තියේ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) එම පාසලේ සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

: ..............................................

(iii) සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් $\frac{3}{4}$ කට ජාතික පාසල්වලට ඇතුළත් වීමට වරප්‍රසාද හිමි වූයේ නම්, එම ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

: ..............................................

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

**31.** රෝස පැහැති දළු හටගන්නා ගසකි.
(1) දෙහි (2) නා (3) බුලත් (4) කොස්

**32.** එක් බීජයක් පමණක් තිබෙන පලතුරකි.
(1) නෙල්ලි (2) දිවුල් (3) මැංගුස් (4) දෙළුම්

**33.** කාල නියමයක් **නොමැතිව** වසර පුරා ම මල් පිපෙන්නේ පහත සඳහන් කුමන ගස වර්ගයේ ද?
(1) රබර් (2) පොල් (3) එරබදු (4) රඹුටන්

**34.** ශාක පත්‍ර ආහාරයට ගන්නා සතෙකි.
(1) මකුළුවා (2) උකුස්සා (3) සමනළයා (4) ගොළුබෙල්ලා

**35.** බොහෝ විට ඇඳුම්වල හෝ සතුන්ගේ සිරුරුවල හෝ ඇලවී ව්‍යාප්ත වන බීජයකි.
(1) තෝර (2) තුත්තිරි (3) කුඩලු (4) වරා

**36.** කැටයම් කරන ලද සන්ධි පේළි ද සහිත විශිෂ්ට කලාත්මක නිර්මාණයකි.
(1) සෙල් ලිපිය (2) පුන්කලස (3) සඳකඩ පහණ (4) පුරාවිද්‍යා ලාංඡනය

**37.** ශ්‍රී ලංකාවේ පිහිටි පූජනීය **නො වන** ඓතිහාසික ස්ථානයකි.
(1) රුවන්වැලිසෑය (2) ගාලු කොටුව (3) ශ්‍රී පාදය (4) ථූපාරාමය

**38.** ශ්‍රී ලංකාවට නැගෙනහිරින් පිහිටා ඇති රටකි.
(1) මැලේසියාව (2) ඉන්දියාව (3) එංගලන්තය (4) ග්‍රීසිය



EXAMMOOD.LK

39. දැති රෝද සහිත උපකරණයකි.
(1) බයිසිකලය (2) විල්බැරෝව (3) හිරමණය (4) විදුලි පංකාව

40. අත් ආවරණ හා පා ආවරණ පළඳින්නේ පහත සඳහන් කුමන ක්‍රීඩාවේ දී ද?
(1) එල්ලේ (2) අත්පන්දු (3) ක්‍රිකට් (4) බැඩ්මින්ටන්

41. 'දිය හොල්මන' ප්‍රයෝජනවත් වන්නේ කා හට ද?
(1) ගොවියාට (2) කිමිදුම්කරුවාට (3) ධීවරයාට (4) පිහිනුම් ක්‍රීඩකයාට


42. පෞද්ගලික ව ම පරිහරණය කළ යුතු භාණ්ඩ වර්ග දෙකකි.
(1) දුරකථනය, පෑන (2) පනාව, දත් බුරුසුව
(3) පනාව, කුඩය (4) කුඩය, දත් බුරුසුව

43. පහත දී ඇති රූපවලින් 'මහවලහා' තරු රටාව පෙන්වන රූපය කුමක් ද?



(1) (2) (3) (4)

44. හිරුඑළිය ඇති ස්ථානයක රූපයේ දැක්වෙන උපකරණ තබා ජල භාජනයේ ඇති ජලය උණුසුම් කර ගත හැකි ය. මෙහි දී A භාජනය ලෙස භාවිත කළ හැක්කේ පහත සඳහන් කවරක් ද?




(1) හොඳින් දිලිසෙන ඇලුමිනියම් තාච්චියක් (2) අලුත් මැටි වළඳක්
(3) විශාල ඝනකමක් ඇති වීදුරු කෝප්පයක් (4) ප්ලාස්ටික් බේසමක්

45. ශරීරය වර්ධනය කිරීම සඳහා වැඩි ම දායකත්වයක් සපයන ආහාර ද්‍රව්‍ය කාණ්ඩයකි.
(1) බත්, සීනි, මුං ඇට (2) පරිප්පු, නිවිති, ගොටු කොළ
(3) පරිප්පු, මුං ඇට, සෝයා බෝංචි (4) අඹ, අන්නාසි, දොඩම්

46. මස් කල් තබා ගැනීමට භාවිත කළ පැරණි ක්‍රමයකි.
(1) ලුණු ද්‍රාවණයක ගිල්වා තැබීම (2) තැම්බීම
(3) මී පැණිවල ගිල්වා තැබීම (4) රසකාරක එකතු කිරීම

47. අතීත රජවරුන් විසින් කරන ලද වාරි කර්මාන්ත මගින් අපේ රටේ ප්‍රධාන වශයෙන් කෙරෙන නිෂ්පාදනයකි.
(1) තේ (2) ලුණු (3) එළවලු (4) සහල්

48. ජලභීතිකාව රෝගය වැළඳීමට හේතු වන රෝග බීජ මිනිස් සිරුරට ඇතුළු විය හැක්කේ පහත සඳහන් කුමන සත්වයාගෙන් ද?
(1) මදුරුවා (2) කැරපොත්තා (3) බළලා (4) ගෙමැස්සා

49. ශ්‍රී ලංකාවේ වාර්තා වන වසංගත රෝග වැඩි සංඛ්‍යාවක් සඳහා හේතු වන සත්ව වර්ගය
(1) මීයන් ය. (2) බල්ලන් ය. (3) මදුරුවන් ය. (4) මැස්සන් ය.

50. ප්‍රසිද්ධ ලේඛකයකු ලෙස හා තාරකා විද්‍යාඥයකු ලෙස ලෝකයට විශිෂ්ට සේවාවක් සිදු කළ අයෙකි.
(1) ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් (2) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක
(3) ආචාර්ය ටී. බී. ජයා (4) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි

51. ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ඔලිම්පික් පදක්කමක් හිමි කර දුන්නේ කවු ද?
(1) සුසන්තිකා ජයසිංහ (2) ඩන්කන් වයිට් (3) ජූලියන් බෝලිං (4) දිපිකා වන්නිගම

52. සමාජ විරෝධී ක්‍රියාවක් **නො වන්නේ** පහත සඳහන් කවරක් ද?
(1) මත්ද්‍රව්‍ය වෙළඳාම
(2) ළමයින් සේවයට යොදවා ගැනීම
(3) දුම්රිය පොළෙහි දී දුම්පානය කිරීම
(4) බස් රථ තුළ ආහාර ද්‍රව්‍ය විකිණීම

53. වැවක් පිහිටන ස්ථානයක් සලකුණු කිරීමට ශ්‍රී ලංකා සිතියම්වල යොදා ගන්නේ
(1) නිල්පාට දිග රේඛාවකි.
(2) නිල්පාට රේඛාවක් මත යෙදූ තිතකි.
(3) නිල්පාටින් පාට කළ කුඩා ප්‍රදේශයකි.
(4) එක් ස්ථානයකට සම්බන්ධ කළ නිල්පාට රේඛා කිහිපයකි.

54. පාසල් වත්තේ මිරිස් පාත්තියක් සකස් කිරීමට තෝරා ගත යුත්තේ
(1) හිරුඑළිය අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු සහිත බිමකි.
(2) බොරලු සහිත ජලය බැසයන තැනිතලා බිමකි.
(3) හිරුඑළිය හොඳින් ලැබෙන ජලය බැසයන බොරලු රහිත තැනිතලා බිමකි.
(4) හිරුඑළිය ඉතා අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු රහිත තැනිතලා බිමකි.

55. යම් පුද්ගලයකුට දේදුන්නක් දර්ශනය විය හැක්කේ පහත සඳහන් කුමන අවස්ථාවේ දී ද?
(1) අකුණු සමග අධික වර්ෂාව ඇති විට
(2) අධික වර්ෂාව සමග සුළඟ ඇති විට
(3) හිරුඑළිය සමග යාන්තමින් වර්ෂාව ඇති විට
(4) හිරුඑළිය සමග වියළි සුළඟ ඇති විට

56. විදුහල්පතිවරයකුට පාසල් වේලාව තුළ දී හදිසි රැස්වීමක් සඳහා ගුරුවරුන් හා සියලු ම සිසුන් ප්‍රධාන ශාලාවට රැස්කර ගැනීමට අවශ්‍ය ව ඇත. පාසලේ සියලු පහසුකම් තිබේ නම්, රැස්වීමට පැමිණෙන ලෙස සියලු දෙනාට ම එකවර දැනුම් දීමට විදුහල්පතිවරයාට යොදා ගත හැකි සන්නිවේදන මාධ්‍යය කුමක් ද?
(1) දුරකථනය (2) පරිගණකය (3) දැන්වීම් පුවරුව (4) ශබ්ද වාහිනිය

57. මාර්ග නීති රීතිවලට අනුව, ශ්‍රී ලංකාවේ මහා මාර්ගවල ධාවන මාර්ග මත රේඛා ඇඳීමට භාවිත කරන වර්ණ මොනවා ද?
(1) කහ, කළු (2) කළු, සුදු (3) කහ, සුදු (4) කහ, රතු

58. ශ්‍රී ලංකාව තුළ පොදු වාහන මගින් සිදු කෙරෙන ගමනාගමන සේවය, මහජනතාවට වඩාත් හිතකර සේවයක් වීම සඳහා පහත කුමන යෝජනාව ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු වේ ද?
(1) නියමිත කාල සටහනකට අනුව සියලු ම පොදු වාහන ධාවනය කිරීම
(2) පොදු වාහන තුළ රූපවාහිනී හා ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම
(3) දහවල් කාලය තුළ පොදු වාහන ධාවනය සීමා කිරීම
(4) ධාවනය වීමේ දී නැවතුම් ස්ථාන කිහිපයක පමණක් පොදු වාහන නතර කිරීම

59. ගිනි ගැනීමකින් ශරීරයේ යම් ස්ථානයක් පිළිස්සුණු පුද්ගලයකුට ප්‍රථමාධාර ලබා දීමේ දී අප විසින් පළමුවෙන් ම කළ යුතු දෙය කුමක් ද?
(1) පිළිස්සුණු ස්ථානයට ඇලී ඇති ඇඳුම් ඉවත් කිරීම
(2) පිළිස්සුණු ස්ථානය මත තෙල් වර්ගයක් ආලේප කිරීම
(3) දිය බිබිලි මත ආලේපන වර්ගයක් ගැල්වීම
(4) පිරිසිදු ඇල් දියෙන් පිළිස්සුණු ස්ථානය සිසිල් කිරීම

60. "සෞභාග්‍යවත් ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතිනා තාක්කල් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා!" මෙම අදහස පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාවේ
(1) ජාතික කොඩියෙනි. (2) රාජ්‍ය ලාංඡනයෙනි. (3) ජාතික වෘක්ෂයෙනි. (4) ජාතික ගීයෙනි.

***

EXAMMOOD.LK EXAMMOOD.LK EXAMMOOD.LK